// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2303/18 - 2022 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2022.10.26
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 6/2017 (i)

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තියේ 3(අ) උපවගන්තිය සහ 31 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 117 වන වගන්තියේ 2(ඩ) උපවගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2022 සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (බ.ජා.ගු.) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.රා.ජා.ගු) සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන (කො.ජා.ගු.ර.) වෙත පැමිණෙන සෑම ගුවන් යානයක්ම පහත දැක්වෙන ගොඩබෑසීම් සහ නැවතුම් ගාස්තු ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු වෙත ගෙවිය යුතු යː-

1A - PG 6017 — 356 (2022/10)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(අ)

| | *ජාත්‍යන්තර ගුවන් ගමන්* | *පුහුණු ගුවන් ගමන් ඇතුළුව අභ්‍යන්තර ගුවන් ගමන්* |
|---|---|---|
| ගොඩබැසීම් | එක් ගොඩබැසීමක් සඳහා ගුවන් යානයේ ඇති මෙට්‍රික් ටොන්* උපරිම ඉගුලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් එකකට හෝ ඉන් කොටසකට, එක්සත් ජනපද ඩොලර් 250ක අවමයකට යටත්ව, එක්සත් ජනපද ඩොලර් 4 බැගින්. | එක් ගොඩබැසීමක් සඳහා ගුවන් යානයේ ඇති මෙට්‍රික් ටොන්* උපරිම ඉගුලුම් බරින් සෑම මෙට්‍රික් ටොන් එකකට හෝ ඉන් කොටසකට රුපියල් 3000/- ක අවමයකට යටත්ව, රුපියල් 300/- බැගින්. |
| නැවතුම් | පළමු පැය 3 සඳහා නොමිලේ. පළමු පැය 3න් පසුව පැය හයක් හෝ ඉන් කොටසක් සඳහා ගොඩබැසීමේ ගාස්තුවෙන් 10% | පළමු පැය 3 සඳහා නොමිලේ. පළමු පැය 3න් පසුව පැය තුනක් හෝ ඉන් කොටසක් සඳහා ගොඩබැසීමේ ගාස්තුවෙන් 10% |

* උපරිම ඉගුලුම් බර මෙ. ටොන්.

(ආ) පහත නිශ්චිතව සඳහන් කර ඇති පරිදි යම් ආකාරයක ප්‍රවේශවීමක් භාවිතා කරමින්, එක් දවසක් තුළ කරනු ලබන අවසාන ගොඩබැසීම සඳහා පුහුණු ගුවන් යානාවලින් අය කිරීමක් කරනු ලැබේ :-

(i) දෘශ්‍යමය පිවිසුම;

(ii) උපකරණ භාවිතයෙන් ප්‍රවේශ වීම ; සහ

(iii) ගගන යාත්‍රාංගනයට ගොඩබැසීමක් නොමැතිව ගුවන් තොටුපළ වටා කලින් නිර්ණය කරන ලද පථයක පියාසර කිරීමේ සහ ගොඩබැසීමේ ප්‍රවේශ වීම (ගුවන් යානයක් එහි රෝද යාත්‍රාංගනය ස්පර්ශ කර ගුවන්ගත වීම )

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කරන ලද යම් ප්‍රවේශයක් සම්බන්ධයෙන් වන විට දී යම් පුහුණු ගුවන් යානයක් අවසාන ප්‍රවෙශ වීම අතහැර නික්ම යාමක දී ගාස්තු අය කිරීමේ කාර්යය සඳහා එක් ගොඩබැසීමක් ලෙස සලකනු ලැබේ.

(2) මේ නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන පරිදි ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු වට්ටමක් නව උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගමකට අදාළ විය යුතු ය. :-

| *ගාස්තු ස්වභාවය* | *ගුවන් තොටුපළේ නම* | *අදාළ ගාස්තු මත වට්ටම් ප්‍රතිශතය* | | | |
|---|---|---|---|---|---|
| | | *1 වන වර්ෂය *** | *2 වන වර්ෂය* | *3 වන වර්ෂය* | *4 වන වර්ෂය* |
| ගොඩබැසීම් සහ නැවතුම් | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (බ.ජා.ගු.) | 50%* | - | - | - |
| | මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.රා.ජා.ගු.) | 100% | 75% | 50% | 25% |
| | කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන (කො.ජා.ගු.ර.) | - | - | - | - |

** මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු සමග ගිවිසුමට එළඹෙන දින සිට පළමු වර්ෂය ආරම්භ වන්නේ ය. එකී වට්ටමට සුදුසුකම් ලැබීම පිණිස ඉන්පසු ඉක්බිතිවම එළඹෙන වර්ෂයන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ය.

* මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළට සතියකට අවම වශයෙන් එක් ගුවන් ගමනක්වත් ක්‍රියාත්මක කිරීමට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු සමග උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගමක් ගිවිසුමකට ඇතුළත් වේ නම් පමණක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සම්බන්ධයෙන් වන වට්ටමට හිමිකම් ලබයි.

3. 2020 සැප්තැම්බර් මස 08 වැනි දිනැති අංක 2192/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝගවලින් අවසන්වරට සංශෝධිත පරිදි 2014 ජූලි මස 02 වැනි දිනැති අංක 1869/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (බ. ජා. ගු.) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (ම.රා.ජා.ගු.) සහ රත්මලාන ගුවන් තොටුපළෙහි (ර.ගු.) ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු නියෝග ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකටත් අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ නියෝගවල -

"ගගන යාත්‍රාංගනය" යන්නට, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"අවසාන ප්‍රවේශ වීම අතහැර නික්ම යාම" යන්නෙන්, ගුවන් යානයක් ගුවන් තොටුපළට ගොඩබැසීම සඳහා වන අවසාන ප්‍රවේශයේ දී ගොඩබැසීමකින් තොරව නැවත ගුවන්ගත වීම අදහස් වේ ;

"ගුවන් තොටුපළ වටා කලින් නිර්ණය කරන ලද පථයක පියාසර කිරීම සහ ගොඩබැසීම" යන්නෙන්, ගුවන්තොටුපළ වටා කලින් නිර්ණය කරන ලද බහුඅස්‍රාකාර වූ පථයක පියාසර කර ගුවන් තොටුපළට ගොඩබැසීම අදහස් වේ. (මෙම ක්‍රියාපටිපාටිය පුහුණුව සඳහා කිහිපවතාවක් නැවත නැවත සිදු කෙරේ) ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නට, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"උපකරණ භාවිතයෙන් ප්‍රවේශ වීම" යන්නෙන්, ගුවන් යානයේ සහ පොළොවේ ඇති ගුවන් සංතරණ උපකරණ භාවිතයෙන් ගුවන් යානයක් ගුවන් තොටුපළකට ගොඩබැසීම අදහස් වේ ;

"නව උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගම" යන්නෙන්, උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සේවාවන් ක්‍රියාත්මක කිරීමට බලය ඇති ගුවන් සමාගමක් අදහස් වේ. 2 වන නියෝගය යටතේ වූ අත්හැරීමක් පවතින උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගම්වලට ස්වයංක්‍රීයව අදාළ නොවිය යුතු ය ;

"ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු" යන්නට, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු" යන්නෙන් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3)(අ) වන වගන්තිය යටතේ පත්කරන ලද ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු අදහස් වේ ;

"ගුවන් යානයක් එහි රෝද යාත්‍රාංගනය ස්පර්ශ කොට ගුවන්ගත වීම" යන්නෙන්, ගුවන් යානයක් ගොඩබැසීමක් සඳහා යාත්‍රාංගනයට ප්‍රවේශ වීමක් සිදුකර ගුවන් යානයේ රෝද යාත්‍රාංගනයේ ස්පර්ශකර ගොඩබැසීම සම්පූර්ණ නොකර ගුවන් ගතවීම අදහස් වේ.

EOG 10 - 0232

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.